# ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂයේ (මාඕවාදී) දේශපාලන මණ්ඩලයේ සාමාජිකයෙකු වන සහෝදර බිමල් සමග සිදු කළ සම්මුඛ සාකච්ඡාවල උපුටා ගැනීම්

## ප්‍රවෘත්ති පත්‍ර වලින් ලබා ගන්නා ලදි

**(2009 මැයි සහ ජුනි)**

**හින්දුස්තාන් ටයිම්ස්:** ඉන්දියානු විප්ලවය ලෙස හඳුන්වනු ලබන, නුඹලා පෙරමුණ ගනිමින් තිබෙන්නෙහි අනාගතය කුමක්ද?

**බිමල්:** ප්‍රාන්ත අටක හෝ නවයක අපට සැලකිය යුතු මහජන පදනමක් තිබෙනවා. ලෝකය පුරාම තවදුරටත් ධනවාදී ආර්ථිකය අර්බුදයකට ඇද වැටෙමින් පවතිනවා, ඉක්මනින්ම ඉන්දියාවත් බටහිර මුහුණ දෙන එම අරමුණටම මුහුණ දේවි. එමනිසා විප්ලවය සඳහා තත්ත්වයන් ඉක්මනින්ම මුහුකුරා යනවා.

**හි.ට.:** ඔබ කලින් ඉස්ලාම් සටන්කාමිත්වයට සහය පළ කරල තිබුණ. මුම්බායි ප්‍රහාරයෙන් පස්සෙ, ඔබ තවමත් එහෙම කරනවද?

**බිමල්:** තුවාලකරුවන් වැඩි ප්‍රමාණයක් මුස්ලිම්වරු වූ වික්ටෝරියා ස්ටේෂන් එකට **(Chhatrapati Shivaji Terminus, or CST)** පහරදුන් ක්‍රමයට අපි සහය දෙන්නෙ නැහැ. ඒ වුනත් අපි හිතනවා ඉස්ලාම් නැගිටීම් මූලිකව ඇමෙරිකන්-විරෝධී සහ අධිරාජ්‍ය-විරෝධී ස්වභාවයට එරෙහි නොවිය යුතු බව. එමනිසා අපිට අවශ්‍යයි එය වර්ධනය කරන්නට.

.........

**හි.ට.:** චට්ස්ගා, ජාක්හැන්ඩ්, ඔරිස්සා, උතුරු බෙංගාලය සහ මහාරාෂ්ට්‍රා වල ඔබේ පක්ෂයේ කල් ඇරීම කොහොමද?

**බිමල්:** චට්ස්ගා, ජාක්හැන්ඩ් සහ ඔරිස්සා ඉන්දියානු දේශපාලනයේ නව කුණාටු මධ්‍යස්ථාන බවට පත්වේවි. අපිට තියෙනවා දිස්ත්‍රික්ක පහක් පුරා පැතිර පවතින අපේ ශක්තිමත්ම පදනම් ප්‍රදේශ චට්ස්ගාවල-විශේෂයෙන්ම පැරණි බස්තාර්වල, දැන් ඒවා මුලුමනින්ම අපේ පාලනය යටතේ. ප්‍රාන්තය තුළ පුහුණු මහජන හමුදව ලක්ෂයකටත් වැඩි ශක්තිමත් එකක්.

සිය ගණන් පොලිස් සහ පැරා මිලිටරි බල ඇණි වට කරල සමූලඝාතනය කර දමන්නට, සටන්කරුවන් 400-500 යුත් කණ්ඩායම් පවත්වාගන්නට උව්‍යමය සම්පත් අප සතුව තිබෙනවා. අපි සංවර්ධන ව්‍යාපෘතිත් දියත් කරල තියෙනවා. ඉතින්, ඔබ සඳහන් කළ අනෙක් දිස්ත්‍රික්කවලත් අපේ බලය ඉහල යමින් පවතිනවා.

**හි.ට.:** ඔබේ පක්ෂය අන්ද්‍රා ප්‍රදේශ්හිදී බලවත් පරාජයන්ට ලක්වුණා. ඔබ ඒකට මොකක්ද කරමින් සිටින්නෙ?

**බිමල්:** ඒක ඇත්ත, අපි අන්ද්‍රා ප්‍රදේශ් වල දැඩි පරාජයන්ට මුහුණ දුන්නා (ප්‍රාන්තය පුරා කලින් විහිදී තිබුණු ප්‍රබල ස්ථාන වලින් පොලීසිය නැක්සලයිට්වරුන්ව එළවා දැමුවා). නමුත් අනිවාර්යයෙන්ම අපි ඒවා නැවත අල්ලගන්නවා මොකද අපේ නායකයින් තවම දන්දකර්ණයා කඳවුරේ පණ පිටින් යහතින් ඉන්නවා. වසර 30 ක් පුරා ඉදිකළ අපේ මහජන පදනම් ප්‍රදේශ තවම නොඉඳුල්. නමුත් යුද්ධය තුළදී හැමවිටම උච්චාවචනයන් ඇතිවේවි.

(හින්දුස්තාන් ටයිම්ස් වාර්තාකරුවෙකුට ලබාදුන් සම්මුඛ සාකච්ඡාවකින් උපුටා ගන්නා ලදි, එම පුවත්පතේ 2009 ජුනි 10 වැනි කලාපයේ පළ කෙරිණි.)

**මින්ට් (Mint):** ඔබ මිනිසුන්ට රැක සිට පහර දී පලා යන බවත්, ඔබට ඔවුන් සමග සටන් කිරීමට ධෛර්යය නැතැයි පරිපාලනය ඔබට චෝදනා කරනවා...

**බිමල්:** ඇත්තවශයෙන්ම මේවා පට්ටපල් බොරු - ඔවුන් දන්නවා අපි පලා යන්නෙ නෑ, නමුත් ඔවුන් එහෙම කියන්නෙ ඔවුන්ට අප සමග සටන් කරන්නට හෝ අපව නොතකා සිටින්නට හෝ යන මේ දෙකින් එකක්වත් නොකළ හැකි නිසයි. නොවැම්බර් 2 වැනිද බුද්ධබාබුගෙ (උතුරු බෙංගාලයේ ප්‍රධාන ඇමති බුද්ධදිබ් බට්ටචර්ජී)

රැකවලුන්ට පහර දෙන විට පවා මම හිටියෙ පිපිරීම් සිදු වුණු ස්ථානයෙන් කිලෝමීටරයක් ඇතුලතයි. විශාල බලකායක් යොදල ප්‍රදේශය පීරා බැලුවා, නමුත් මම පැනල ගියේ නැහැ. බෙංගාලයේ (උතුරු) ඉන්න අපේ හැම සහෝදර සහෝදරියක්ම භූමියේ දූ පුතුන්. ඔවුන් කොහේට පැනල යන්නද? ජනතාවට පිටුපසින් පෙනී ඉඳල අපි කැළැල් ඇති කරන්නෙ නැහැ. මට පේන විදියට ලක්ෂ ගණන් ගම්වැසියන් සහ ආදිවාසීන් දන්නවා මම ඔවුන් සමග ක්‍රමයෙන් අන්‍යෝන්‍යාව බල පවත්වනවා....

**මින්ට්:** ඔබ කොහොමද ප්‍රාදේශීයයන් සමග ගැට ගැසිල ඉදිරියට යන්නෙ?

**බිමල්:** ජනතාවට දැනගන්නට නොලැබෙන අතිශය සංකීර්ණ ක්‍රියාකාරිත්වයක් අපි ගෙන යනවා. මක්නිසාදයත් ඔවුන්ට පරිපාලනය ගැන විශ්වාසයක් නෑ, ඔවුන්ගේ දෛනික ගැටලුවලදී ඔවුහු අප ළඟට එනවා. ඔවුන්ගේ දුක් ගැනවිලි ඉදිරිපත්කළ හැකි කඳවුරු අපි ගම්මානවල සංවිධානය කරනවා. අපි ගම්වැසියන් සමග කටයුතු කරන්නෙ අතිශය කරුණාවෙන් සහ දයාවෙන් ඒකයි ඔවුන් අපට ආදරය කරන්නෙ අපව ආරක්ෂා කරන්නෙ. අපි කාන්තාවන්ගේ විමුක්තිය සඳහාත් වැඩ කරනවා. කාන්තාවන් බොහොමයක් ඉන්නවා ඔවුන්ගේ නැන්ද-මාමලාගේ, සැමියගේ සහ දෙමව්පියන්ගෙ හිංසනයට ලක් වුණු. නමුත් ඔවුන්ට විරෝධය පාන්නට බැහැ ඒ ඔවුන් යැපෙන්නෙ ඒ අයගෙන් නිසා. අපි එවැනි කාන්තාවන්ගේ විමුක්තිය සඳහා සටන් කරනවා. කාන්තාවන් අපේ ව්‍යාපාරයට අතිශය වැදගත්. රට පුරාම සිටින බොහෝ කාන්තාවන් අපේ අරගලයට සම්බන්ධ වෙලා තියෙනවා.

අපි යුදවැදිල තියෙන බොහෝ සටන් වලදී ඔවුහු පෙරමුණේ සිට නායකත්වය ගෙන තිබෙනවා. කොහොම නමුත් උතුරු බෙංගාලයේ අපේ කාන්තා කාඩර්වරු ජාක්හැන්ඩ්, දන්දකර්ණයා සහ අන්ද්‍රාප්‍රදේශ් යන අනෙක් ප්‍රදේශ සමග සංසන්දනාත්මකව බැලුවම ශක්තියෙහි මඳ අඩු බවක් තිබෙනවා. නමුත් හැමතැනම පිරිමි කාන්තා අනුපාතය 50:50 සහ 60:40 පවා, කාන්තා දයකත්වය ඉහළයි, බෙංගාලයේ එම අනුපාතය 70:30 යි (පිරිමි දයකත්වය ඉහළයි). අපේ ගරිල්ලා මෙහෙයුම් විතරක් නෙවෙයි, ලාල්ගාර් සහ නන්දිග්‍රාම් වැනි උතුරු බෙංගාලයේ බොහෝ ප්‍රදේශ වල ශක්තිමත් මහජන ව්‍යාපාරවලට අපි නායකත්වය දෙනවා. අපේ පක්ෂයේ සාමාජිකයන් නොවුනත් හුඟක් කාන්තාවෝ එවැනි ව්‍යාපාරවලට සහභාගි වෙනවා. එළිපිට කෙරෙන එම ව්‍යාපාර දේශපාලන පරිණතභාවයකට මග පෙන්වනවා. පක්ෂය සඳහා අපිට අවශ්‍යයි පරිණත සංවිධායකයින් සහ මේ ව්‍යාපාරවලට ක්‍රියාකාරීව සහභාගි වෙලා තියෙන කාන්තාවන් බඳවා ගන්නත් බලනවා.

..........

**මින්ට්:** ඔබේ ව්‍යාපාරයට ජනතාව බඳවා ගන්නේ කොහොමද?

**බිමල්:** අපිටම අයත් ගම්මානවලින් විතරක් බඳවා ගැනීම් කරන්නෙ නැහැ. පක්ෂයේ පාලනයට යටත්ව ප්‍රාදේශීයව යෝජනා ලබා ගැනීමේ යාන්ත්‍රණයක් අපට තියෙනවා. අයදුම්කරුවන්ගේ දෙමව්පියන්ගෙන් අනුමැතිය ලබාගත් පසු අපේ එක් කමිටුවක් වෙතට අපි යෝජනාවන් ගෙනියනවා. එය ඔවුන්ව පරීක්ෂා කොට පුද්ගලයාගේ පූර්ව තත්ත්වය, ඔහුගේ හෝ ඇයගේ ගම තුළ අනෙක් අය උදෙසා පංතිමය සහ චරිත හැසිරීම මත බඳවා ගන්නවාද නැද්ද යන අවසන් කැඳවීම ලැබෙනවා. මම මූලිකත්වය ගන්නවා නවක බඳවාගත් අය කණ්ඩායම් වගකීම්වලට පුහුණු කරන්න. අපි ජීවත්වෙන දුෂ්කර ජීවිතය නිසා හුඟක් අය ආරම්භයේදී භය වෙනවා, නමුත් හුඟක් දෙනා අවසානයේදී ඒකත් එක්ක පොර බදන්න ඉගෙන ගන්නවා.

.........

(මින්ට්, 2009, මැයි 29)

**මින්ට්:** ඔබට කොච්චර කාලයක් අල්ලගෙන ඉන්න වේවිද? රජය විශාල වශයෙන් අලුත් බල ඇණි පුහුණු කරනවා.

**බිමල්:** ඔවුන්ට ඉඩහරිමු තවත් පොලිස් කම්පැනි 500 ක් එවන්න. අපි සූදනම්. මේ දිග්ගැස්සුණු යුද්ධය ඉක්මනින්ම අවසන් වෙන්නෙ නෑ. අපේ විරුද්ධවාදියාගෙ ශක්තිය ගැන සම්පූර්ණ අවබෝධයකින් යුතුව අපිට සූදනම් වෙන්න තියෙනවා. අපිට ඇති තරම් සම්පත් තියෙනවා.... නමුත් විශේෂයෙන්ම අපට ප්‍රාදේශීයයන්ගේ සහය තියෙනවා, සමස්ත ප්‍රදේශයම ඔවුන්ගෙන් වටවෙලා. බුද්ධබාබුට කියන්න ඔහුගේ බල ඇණි අපිත් එක්ක - ගරිල්ලන් එක්ක සටන් කළ යුතුයි - නැතුව ආදිවාසීන් එක්ක නොවෙයි.

**මින්ට්:** ඒ වගේම ඔබ ආදිවාසීන්ව මිනිස් පළිහක් විදිහට යොදගන්නවා කියන එකට එකඟ වෙනවද .....

**බිමල්:** අපි කිසි කලෙක ආදිවාසීන්ව මිනිස් පළිහක් විදියට භාවිතා කරල නැහැ. ඔවුන් කැමැත්තෙන්ම අපිත් එක්ක.... ඒ වගේම ඔවුන්ගේ සමහරෙක් අපේ බලඇණිවලට නායකත්වය දෙනවා. එන්න ලාල්ගා වලට ඔබට වැඩි වෙලාවක් යන්නෙ නෑ තේරුම් ගන්න ඔවුනු අපට සහය දෙනවා, එම සහයෝගය සම්පූර්ණයෙන්ම ස්වේච්ඡාවෙන්.

**මින්ට්:** බොහෝ සිවිල් වැසියන් මේ සටන් අතරතුරදී මිය යන්නට ඉඩ තියෙනවා. මේ මියයාම් ගැන ඔබට සදචාරාත්මක වගකීමක් නැද්ද?

**බිමල්:** යුද්ධයේදී සිවිල් වැසියො නැහැ - ඉන්නෙ මිනිසුන් විතරයි ඔබට පක්ෂව හෝ එරෙහිව.

**මින්ට්:** එතකොට සදචාරාත්මක වගකීම.

**බිමල්:** ලේ වැගිරීම්වලට මධ්‍යම සහ ප්‍රාන්ත රජයන් වගකිව යුතුයි. අපි නැවත නැවතත් ඔවුන්ට ආයාචනා කරල තියෙනවා ඔවුන්ගේ බලඇණි ඉවත් කරගන්න, සාකච්ඡාවලට එන්න කියල නමුත් ඔවුන් ඒක ගණන් ගත්තෙ නැහැ (ආයාචනය). ඒ නිසා ඔවුන්ට ප්‍රතිවිපාක වලට මුහුණ දෙන්න ඉඩ දෙමු. නමුත් ඇත්තෙන්ම මේ යුද්ධයේදී ප්‍රාදේශීයයන් මියයනවනම් මට ඒ වේදනාව දැනෙනවා.

**මින්ට්:** රජය අවසානයේදී එකඟ වුණානම් ඔබේ යෝජනාවට අනුව සංවාදයකට එන්න ඔබ එනවද?

**බිමල්:** රජය එකඟ වෙනවනම් සාකච්ඡාවකට හෝ විවාදයකට ලාල්ගාවල ජනතාවත් ඒකෙ කොටස්කරුවෙක් වේවි. රජයට සිදුවේවි සිවිල් වැසියන් සහ ඔවුන්ගේ නියෝජිතයන් සමග වාඩි වෙන්න ඔවුන්ට අවශ්‍ය මොනවද කියල තේරුම් ගන්න.

**මින්ට්:** මධ්‍යම බලඇණි ලාල්ගා වලින් අකුලා ගත යුතුයැයි මමටා බනර්ජී (සමස්ත දුම්රිය මාර්ග ඇමති සහ ට්‍රිනාමූල් කොංග්‍රසයේ නායකයා, උතුරු බෙංගාලයේ ප්‍රධාන විපක්ෂය) රජයට බල කළ යතු යැයි ඔබ කියමින් ඉඳල තියෙනවා. ඇය ඒ සඳහා ඇප වේවි කියල ඔබ අපේක්ෂා කරනවද? ඔබේ පක්ෂය ට්‍රිනාමූල් බල ඇණිවලට සම්බන්ධයිද?

**බිමල්:** මට ඔබට කියන්න ඉඩ දෙන්න ට්‍රිනාමූල් කොංග්‍රසය කිසිදක අප සමග නැහැ. නන්දිග්‍රාම් හි අපිටම අයත් සිංගර් එක්ක අපි හිටියෙ, අපි ගිහිල්ල තියෙනවා ප්‍රාදේශීයයන්ට උදව් කරන්න. අපි ජනතාව වෙනුවෙන් සටන් කරනවා, අපිට ඉන්න එකම හවුල් කරුවන් පීඩනයට පත්වූ ජනතාව. මාඕවාදීහු සලකනවා පීඩකයන් ඔවුන්ගේ දරුණුතම සතුරන් විදියට, රාජ්‍ය පරිපාලනය සහ CPM (ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය - මාක්ස්වාදී) ය විසින් දශක කිහිපයක් තිස්සේ ලාල්ගාවල ආදිවාසී ජනතාව පීඩාවට ලක්කරමින් තිබෙනවා.

(මින්ට්, 2009, ජුනි 22.)

**බිමල් හින්දුස්තාන් ටයිම්ස් ට; ජුනි 18:** පොදුජන මතය අභියෝගයට ලක් කිරීමෙන් ඔවුහු යුද්ධයට මුල පුරල තියෙනවා. දැන් කිසිවෙක් අපට දෙස්පැවරිය යුතු නැහැ ලේ වැගිරීම් වෙනුවෙන්.... ප්‍රාන්ත සහ මධ්‍යම රජයන් ලාල්ගාවලදී කළාට වඩා ජර්මනිය රුසියාව තුළ බොහෝ ආක්‍රමණ දියත් කළා. දැන් හැමකෙනෙකුටම ඉඩ හරිමු ලාල්ගාහි ජනතාව සටන් වදින්නෙ කොහොමද කියල බලාගන්න. රජය කල්පනා කළා ජනතාවගේ දුක්ගැනවිලිවලට ඇහුම්කන් දීල ඔවුන්ට ඒව විසඳල දෙන්න, නමුත් ඔවුන් තෝරගත්ත බලය යෙදවීමේ මාර්ගය. ජනතාවගේ තීරණයට එරෙහිවීමට විපාකයක් වශයෙන් ඔවුන්ට ගෙවන්නට සිදුවේවි.

[ජනතා සත්‍ය, #7, 2009 අගෝස්තු]

පරිවර්තනයකි
නව මාක්ස්වාදී අධ්‍යයන කණ්ඩායම
T #19

http://slmarxist.yolasite.com
slmarxist@ymail.com